


- ඔබ මූලික කොටස් නිකුතුවකින් (IPO) කොටස් මිලදී ගැනීමට අපේක්ෂා කරන්නේ නම් කොටස් මිලදී ගැනීමට පෙර අනිවාර්යයෙන්ම සංස්ථා ප්‍රකාශය (Prospectus) ඉතා ප්‍රවේශමෙන් කියවිය යුතුය. ඒ සඳහා ඔබට ප්‍රමාණවත් තරම් අවබෝධයක් නොමැති නම් ඔබ තෝරාගෙන ඇති කොටස් තැරැව්කාර සමාගමේ ආයෝජන උපදේශකවරයාගේ සහයෝගය ලබාගත හැකිය.

  ඔහුගේ උපදෙස් අනුව ඔබට නිසි ආයෝජන තීරණ ගැනීමට මගපෙන්වීමක් සිදු කරනු ඇත.

- ඔබ මෙහිදී මතක තබාගත යුතු විශේෂ කරුණක් වනුයේ සංස්ථා ප්‍රකාශයෙහි අන්තර්ගත කර ඇති කරුණු හා ඔබ එකඟ වන්නේ නම් පමණක් හා ඔබ එම කරුණු පිළිබඳව සෑහීමකට පත් වන්නේ නම් පමණක් මූලික කොටස් නිකුතුවකින් කොටස් මිලදී ගැනීම වඩා යෝග්‍ය බවයි. මූලික කොටස් නිකුතුවකින් කොටස් මිලදී ගැනීම ප්‍රාථමික කොටස් වෙළෙඳපොළ යනුවෙන් ද හඳුන්වනු ලබයි.

- කොටස් තැරැව්කාර නොවන ආයතන සමඟ කොටස් ගණුදෙනු නොකරන්න.

  දැනට ලංකාව තුළ, ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව මගින් ආයතන 29ක් සඳහා තැරැව්කාර ආයතන වශයෙන් කටයුතු කිරීමට බලපත්‍ර ලබාදී ඇති අතර ඉන් ආයතන 25ක් කොටස් හා ණයකර ගණුදෙනු කරන කොටස් තැරැව්කාර ආයතන වන අතර ආයතන 4ක් ණයකර පමණක් ගණුදෙනු කිරීමට බලපත්‍ර ලබා ඇත. ආයෝජකයකු මෙම ආයතන සමඟ පමණක් ගණුදෙනු කරමින් කොටස් හෝ ණයකර වල ආයෝජනය කිරීමට සැළකිළිමත් විය යුතුය.

  එයට අමතරව ආයෝජන කළමනාකරණ සමාගම්, ආන්තික ණය සැපයුම් ආයතන, ඒකක භාර වැනි සාමූහික ආයෝජන යෝජනා ක්‍රම, කොටස් ප්‍රාරක්ෂණ සමාගම්, ණය ප්‍රමාණීකරණ නියෝජිතායතන ද තම සේවා සැපයීම සඳහා ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවෙන් බලපත්‍ර ලබා ඇත. මෙම ආයතන සියල්ල ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ අධීක්ෂණයට ලක් වන අතර එම ආයතන පිළිබඳ ලයිස්තුවක් ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ වෙබ් අඩවිය වන www.sec.gov.lk තුළින් ලබාගත හැක.

- කොටස් වෙළෙඳපොළෙහි ආයෝජනය කරන ආයෝජකයින් මෙම කරුණු පිළිබඳව අවදියෙන් සිට අවශ්‍ය වේලාවේදී නිසි ආයෝජන තීරණ ගැනීම ඉතා වැදගත්ය. දිනපතාම අපහසු වුවත්, හැකි සෑම විටම තමන් මිලයට ගෙන තිබෙන කොටස් වල මිල ගණන්, එම සමාගම්වල නිවේදන පිළිබඳව සෙවිල්ලෙන් සිටිය යුතුය. සමහර ආයෝජකයන් කොටස් මිලයට ගෙන මාස කිහිපයකට පසුව ඒ පිළිබඳව සොයා බලති. එය විශාල වරදකි. යම් හෙයකින් එම කාලය තුළ කොටස් මිල ඉහළ ගොස් තිබුණේ නම් එම ආයෝජකයාට එම කොටස් විකිණීමට තිබූ අවස්ථාවක් මඟහැරී තිබිය හැකිය. කොටස් වෙළෙඳපොළේ ආයෝජනය යනු බැංකුවක මුදල් තැන්පත් කිරීමක් මෙන් නොවේ. නිරන්තර සෙවිල්ලෙන් සිටීම හරහා ආයෝජනයේ පවතින අවදානම අවම කර ගැනීමට එය ඉතා වැදගත් වේ. එසේ කිරීමට අපහසු ආයෝජකයකු වේ නම් ඔහු/ ඇය විසින් සිදු කළ යුත්තේ ඒකක භාර වැනි සාමූහික ආයෝජන යෝජනා ක්‍රම වෙතට යොමුවීමයි. එහෙත් ඒකක භාරවල ආයෝජනයේදී විමසිල්ලෙන් සිටිය යුතු නැතැයි ඉන් අදහස් නොවේ.

SEC | SECURITIES AND EXCHANGE COMMISSION OF SRI LANKA

**ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව**
28 සහ 29 වන මහළ, නැගෙනහිර කුළුණ.
ලෝක වෙළෙඳ මධ්‍යස්ථානය, එච්ලන් චතුරශ්‍රය
කොළඹ 01.
දුරකථන : +94 11 2143843
ෆැක්ස් : +94 11 2439149
ඊ-මේල් : mail@sec.gov.lk
වෙබ් අඩවිය: www.sec.gov.lk




# ඔබ

## කොටස් වෙළෙඳපොළෙහි ආයෝජනය කිරීමට අපේක්ෂාවෙන් සිටින ආයෝජකයෙක්ද?

# එසේ නැතහොත්

## දැනට ආයෝජනයෙහි නිරත වන්නෙක්ද?

---

## කොටස් වෙළෙඳපොළ ආයෝජනයේදී ඔබ සැළකිලිමත් විය යුතු විශේෂ කරුණු




**පහත සඳහන් වනුයේ කොටස් වෙළෙඳපොළෙහි ආයෝජනය කිරීමේදී ඕනෑම ආයෝජකයකු සැළකිල්ලක් දැක්විය යුතු මූලික සාධකයන් කිහිපයකි.**

- ඔබ ආයෝජනය ආරම්භ කිරීමට පෙර කොටස් වෙළෙඳපොළ ආයෝජනයෙහි මූලික කරුණු පිළිබඳව නිසි අවබෝධයක් ඔබට තිබිය යුතුය. එමගින් ඔබගේ ප්‍රතිලාභ ඉහළ මට්ටමක රඳවා ගැනීමට හැකියාව ලැබෙනු ඇත.

- කොටස් මිලදී ගැනීම යනු ආයෝජනයකි. එය ඉතිරි කිරීමක් නොවේ. ඕනෑම ආයෝජනයක ලාභ හෝ අලාභ අන්තර්ගත විය හැකිය. එමෙන්ම අවදානමක් දැරීමට සිදු වනු ඇත. ඒ අනුව ඔබ උත්සාහ කළ යුත්තේ අවදානම අවම කර ගනිමින් ප්‍රතිලාභ උපරිම කර ගැනීමටය. ඒ සඳහා කළ හැකි සහ අනුගමනය කළ යුතු දේ බොහෝය.

- කොටස් මිලදී ගැනීම යනු ඔබ සමාගමක හිමිකරුවෙකු බවට පත්වීමකි. කොටස් මිලදී ගැනීමේ ප්‍රතිලාභයක් ලෙස ඔබට ලාභාංශ මෙන්ම නොමිලේ සහ අඩුමිලකට කොටස් ලැබීමට අවස්ථාවන් ලැබෙනු ඇත. මෙහිදී ඔබ තේරුම්ගත යුතු වැදගත් කරුණක් වන්නේ සමාගමක් ලාභ ලබන තත්ත්වයට පත්වීමට කාලයක් ගත විය හැකි බවයි. ඊට අමතරව කාලයක් සමඟ සමාගමේ වටිනාකම ඉහළයාමත් සමඟ කොටසක මිල ඉහළ යා හැකිය. කොටස් වෙළෙඳපොළ තුළින් පූර්ණ ප්‍රතිලාභ අත්කර ගැනීමට යම් කාලයක් කැප කිරීම කළ යුතු වේ.

- කාලයත් සමඟ සමාගමක වටිනාකම ඉහළයාම නිසා සිදුවන කොටසක මිල ඉහළයාම තුළින් කොටස් වෙළෙඳපොළ ආයෝජනයෙන් ආයෝජකයන් මූලිකවම බලාපොරොත්තු වන ප්‍රාග්ධන ලාභ ලැබීමට හැකියාව ලැබේ. මෙම නිසා කොටස් වෙළෙඳපොළ තුළින් පූර්ණ ප්‍රතිලාභ අත්කර ගැනීමට නම් යම් කාලයක් කැප කළ යුතු අතර හදිසි වියදම්වලට වෙන්කර ඇති මුදල් යොදවා කොටස්වල ආයෝජනය සුදුසු නොවේ.

- කොටස් වෙළෙඳපොළ තුළ ගණුදෙනු කිරීමට ඔබ අපේක්ෂා කරන්නේ නම් කොළඹ කොටස් වෙළෙඳපොළ විසින් මෑතකදී හඳුන්වා දී ඇති මොබයිල් ඇප් පහසුකම හරහා හෝ ඔබට අවශ්‍ය නම් කොටස් තැව්කාර

ආයතනයක් වෙත පිවිස සී ඩී එස් ගිණුමක් ආරම්භ කළ හැකිය. එම ගිණුම කොටස් තැරැව්කාර ආයතනයක් හරහා විවෘත කළ යුතුය. එසේම මෙම ගිණුම වයස අවුරුදු 18 ඉක්මවන ඕනෑම පුද්ගලයෙකුට නොමිලයේ ආරම්භ කර ගත හැකි ය. එසේම මෙම ගිණුම හැඳින්වීමට විවිධ නම් ආයෝජකයන් භාවිතා කරන අතර CDS ගිනුමක්, සුරැකුම්පත් ගිණුමක්, මධ්‍යම තැන්පතු ගිනුමක්, යනාදී නම් ඉන් කිහිපයකි. මෙම ගිනුමක් නොමැතිව කොටස් වෙළෙඳපොළෙහි ආයෝජනය කළ නොහැක. මෙම ක්‍රම හරහා සී ඩී එස් ගිණුමක් ආරම්භ කිරීමේදී ඔබගේ ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් අවශ්‍ය වන අතර ඔබගේ ජාතික හැඳුනුම්පතේ ලිපිනය වෙනස් නම් පමණක් ස්ථිර ලිපිනය තහවුරු කරන විදුලි බිල්පතක්, දුරකථන බිල්පතක් ආදී ලියවිල්ලක් ඉදිරිපත් කළ යුතු වේ.

- ඔබට අවශ්‍ය නම් අන්තර්ජාල ගණුදෙනු (Online Trading) ආරම්භ කිරීමටද පහසුකම් ඇත. දැනට ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ බලපත්‍රලාභී බොහෝ තැරැව්කාර සමාගම් තම ගණුදෙනුකරුවන් සඳහා මෙම අන්තර්ජාල ගණුදෙනු පහසුකම ලබාදී ඇත.

කොටස් ගැණුම් ඇණවුම්, විකුණුම් ඇණවුම් තමන් විසින්ම පරිඝනකයට ඇතුළත් කොට කොටස් ගණුදෙනුවල නිරතවීම මෙම අන්තර්ජාල ගණුදෙනු ලෙස හඳුන්වනු ලබයි. ඒ සඳහා ඔබට දැනුම, සහ හැකියාව ඇති බවට ඔබ විශ්වාස කරන්නේ නම් එම පහසුකම ඉල්ලා සිටිය හැක.



- සෑම අවස්ථාවකදීම ඔබ ලියාපදිංචි ආයෝජන උපදේශකයකවරයෙකුගෙන් (Registered Investment Advisor -RIA) උපදෙස් ලබාගත යුතුය. ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව යටතේ බලපත්‍රලාභී කොටස් තැරැව්කාර සමාගම්වල ලියාපදිංචි ආයෝජන උපදේශකවරුන් සේවා නියුක්තව ඇති අතර ඔවුන් ඔබට නිසි ආයෝජන තීරණ ගැනීම සඳහා අවශ්‍ය සහයෝගය ලබාදෙනු ඇත.

- ලියාපදිංචි ආයෝජන උපදේශකවරයෙක් වීමට අවශ්‍ය මූලික සුදුසුකම වන ප්‍රාග්ධන වෙළෙඳපොළ සහතික පත්‍ර පාඨමාලාව මෙහෙයවනු ලබන්නේ ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවයි. කොටස්, ණයකර, සාංගමික ආචාරධර්ම, ඒකක භාර, ඇතුළු තවත් විෂයයන් එම පාඨමාලාවට අයත්ය. එය සමත් වී කොටස් තැරැව්කාර ආයතනයක වසරක පළපුරුද්දක් ලබා ඇත්තෙකුට RIA තත්ත්වය ලබා ගැනීම සඳහා වන සම්මුඛ පරීක්ෂණය විද්වත් මණ්ඩලයක් මගින් සිදු කරනු ලබයි. එයින් සමත් වූ අය RIA වශයෙන් හඳුන්වනු ලබයි. මෙම පාඨමාලා පිළිබඳ පුළුල් විස්තර ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ ප්‍රාග්ධන වෙළෙඳපොළ අධ්‍යාපන අංශයේ www.cmetsec.gov.lk යන වෙබ් අඩවිය මගින් ලබාගත හැකිය.

- කොටස් මිලදී ගැනීම, විකිණීම සඳහා අවශ්‍ය උපදෙස් ලියාපදිංචි ආයෝජන උපදේශකයින් හරහා ඔබට ලබාගත හැකි අතර ආයෝජනයෙහි අවසාන තීරණය ඔබ සතුය. එනම් කොටස් විකිණීමක් හෝ කොටස් මිලදී ගැනීමක් සඳහා ඔබ ආයෝජන උපදේශකවරයාට ඇණවුමක් භාර දෙන විට සමාගම කුමක්ද, කොටස් ප්‍රමාණය කුමක්ද සහ කොටසක මිල කුමක්ද යන්න දැනුම් දිය යුතුයි. ආයෝජනයේ අවසාන තීරණය යනු එයයි. උදාහරණ ලෙස XYZ සමාගමෙන් කොටස් 1, 000ක් කොටසක් රුපියල් 258 බැගින් මිලදී ගැනීමට හෝ විකුණා දැමීමට ඇණවුමක් ආයෝජන උපදේශකවරයෙක් වෙත ලබාදිය හැකිය. එම තීරණය ගැනීමට පෙර ආයෝජන උපදේශක සමඟ ඒ පිළිබඳව සාකච්ඡා කළ හැක. එසේම ඔබ අන්තර්ජාල ගණුදෙනු හරහා කොටස් මිලදී ගැනීම් විකිණීම් සිදු කරන්නේ නම් ආයෝජන තීරණ ගැනීමට පෙර ආයෝජන උපදේශක සමඟ සාකච්ඡා කළ යුතුය.

- විශේෂයෙන්ම කොටස් මිලදී ගන්නා සමාගම පිළිබඳව පූර්ණ අවබෝධයක් ඔබ සතු විය යුතුය. ආයෝජනය කිරීමට බලාපොරොත්තුවන සමාගම සම්බන්ධයෙන් ලබාගත හැකි තොරතුරු හැකිතරම් රැස්කර ගැනීමට ඔබ වගබලා ගත යුතුය. ලයිස්තුගත සමාගමේ ලාභදායීත්වය, අනාගත වර්ධනීය තත්ත්වයන්, සමාගමේ ශුද්ධ වත්කම් වටිනාකම, එහි ඉතිහාසය, එම සමාගම අයත් ව්‍යාපාර ක්ෂේත්‍රයෙහි වර්ධනය, සමාගමේ නිෂ්පාදනයන් මොනවාද, නිෂ්පාදනයන් සඳහා ඇති ඉල්ලුම් සහ සැපයුම් තත්ත්වයන් ආදී කරුණු පිළිබඳව පුළුල් ලෙස ඔබ දැනුවත්ව සිටීම ඉතා වැදගත්ය. මෙම තොරතුරු ලබාගැනීම අසීරු කරුණක් නොව ඒවා ඔබගේ ආයෝජන උපදේශකවරයාගෙන් හෝ අදාළ සමාගමේ වාර්ෂික වාර්තාවෙන් ලබා ගත හැකිය. ඊට අමතරව අදාළ ලයිස්තුගත සමාගම්වල වෙබ් අඩවි වල තොරතුරු අන්තර්ගත කරයි.

- කාර්යසාධනය අතින් ඉහළ සමාගම් තෝරා ගැනීමට සෑම විටම උත්සාහ කරන්න. සමාගමක සෑම අංශයකින්ම යහපත් වාතාවරණයක් පෙන්නුම් කරන්නේ නම් එවැනි සමාගම් ආයෝජනය සඳහා වඩා සුදුසුය. කොටස් වෙළෙඳපොළෙහි ලයිස්තුගත සියළුම සමාගම් එක හා සමානව ආයෝජකයන්ට ප්‍රතිලාභ අත්කර දීමක් දැකගත නොහැකිය. කලින් කලට සමහර සමාගම්වල කාර්යසාධනයන් වෙනස් ස්වරූප ගත හැකිය. ඊට හේතුව කොටස් වෙළෙඳපොළෙහි ඇති සමහර ව්‍යාපාර ක්ෂේත්‍ර වඩාත් ක්‍රියාකාරීවීමට පටන් ගන්නේ අවුරුද්දේ යම් කාලයක් තුළය. උදාහරණ ලෙස සංචාරක ව්‍යාපාරය, වැවිලි කර්මාන්ත අංශය, පෙන්වා දිය හැකිය. කාර්යසාධනය අතින් ඉහළ සමාගම් හඳුනාගැනීම එතරම් අපහසු කටයුත්තක් නොවේ.

- ප්‍රාග්ධන වෙළෙඳපොළ නියාමනය කරනුයේ තොරතුරු හෙළිදරව් කිරීමේ පදනම භාවිතා කරමින්ය. ඒ අනුව නියාමන ආයතනයේ (ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ) සහ ලයිස්තුගත සුරැකුම්පත් මිලදී ගැනීම සහ විකිණීම සඳහා පහසුකම් සපයන්නාගේ (කොළඹ කොටස් හුවමාරුවේ) ප්‍රධාන කාර්යය ආයෝජකයන්ට දැනුවත් ආයෝජන තීරණ ගැනීම සඳහා අවශ්‍ය සියළු මිල සංවේදී තොරතුරු ලයිස්තුගත සමාගම් විසින් හෙළිදරව් කරනවාද යන්න නියාමනය කරයි.

- කෙසේ වුවද ඔබට ඉහත සඳහන් කළ ආකාරයෙන් කොටස් වෙළෙඳපොළෙහි ආයෝජනය සඳහා ප්‍රමාණවත් දැනුමක් හෝ කාලයක් නොමැති නම් සහ අවදානම් කළමනාකරණය කර ගනිමින් ආයෝජනය කළ නොහැකි නම් වඩා සුදුසු වනුයේ ඔබ ඒකක භාර ආයෝජනය වෙත යොමුවීමයි.

- කටකථා සහ ආරංචි මත කොටස් මිලදී ගැනීම සුදුසු නොවේ. ප්‍රථමයෙන් ඒවා පිළිබඳ සොයා බැලීමක් කර තහවුරු කර ගැනීම වැදගත්ය.

- තමාගේ මිතුරෙකු හෝ වෙනයම් පුද්ගලයෙකු පැවසූ පමණින් ආයෝජනය නොකර ඒ පිළිබඳව හොඳින් හදාරන්න. කොටස් වෙළෙඳපොළට පිවිස සිටින සමහර ආයෝජකයන් කොටස් මිලදී ගැනීමට පෙළඹී ඇත්තේ විවිධ කටකථා සහ ආරංචි පදනම් කරගෙනය. විශේෂයෙන් සමහර ආයෝජකයන් විසින් පතුරුවනු ලැබූ කටකථාවක් පදනම් කරගෙන තවත් සමහර ආයෝජකයන් විසින් කොටස් මිලදී ගැනීමට පෙළඹේ. එසේම කොටස් වෙළෙඳපොලේ ආයෝජනය කරන මහාපරිමාණ ආයෝජකයන් යම් සමාගමක කොටස් මිලදී ගනිමින් සිටින්නේ යැයි යන ආරංචිය/ කටකථාව මත සමහර ආයෝජකයන් එම සමාගමේ කොටස් මිලදී ගැනීමට පෙළඹේ. ආරංචිය/ කටකථා මත පදනම් කරගෙන මෙවැනි ආයෝජන තීරණ ගැනීම ඉතා අවදානම් සහගත කටයුත්තකි. මහා පරිමාණ ආයෝජකයන් යම් සමාගමක කොටස් මිලදී ගනිමින් සිටින්නේ යැයි යන ආරංචිය මත කොටස් මිලදී ගන්නා සමහර ආයෝජකයන් එම කොටස් මිලදී ගන්නා විට සමහර විට එම මහා පරිමාණ ආයෝජකයන් එම සමාගමේ තමන් මිලයට ගත් කොටස් විකුණා අවසන් වී තිබිය හැකිය. එසේත් නැත්නම් එම කටකථාව සම්පූර්ණ අසත්‍ය විය හැකිය.

කටකථා සහ ආරංචි මත කොටස් මිලදී ගැනීම ලොව ඕනෑම කොටස් වෙළෙඳපොළක සිදුවන දෙයකි. නමුත් ආයෝජකයා මතක තබා ගත යුතු වැදගත් කරුණක් වන්නේ එය ඉතා අවදානම් සහගත ක්‍රියාවක් බවයි. මෙවැනි කටකථා නොවැලැක්විය හැකි කරුණකි. නමුත් ආයෝජකයා විසින් මතක තබා ගත යුතු තවත් වැදගත් කරුණක් වන්නේ සෑම සමාගමක්ම තමන්ගේ ව්‍යාපාර තීරණ (තම කොටස් මිලට බලපෑමක් විය හැකි) කොටස් වෙළෙඳපොළට ලිඛිතව දැනුම් දෙන බවයි. එම නිවේදන කොටස් වෙළෙඳපොළ විසින් එසැනින් ආයෝජකයන් හට (තම වෙබ් අඩවිය හරහා) කොටස් තැරැව්කාර ආයතනවලට සහ මාධ්‍යයට ලබා දේ. කටකථා මත පදනම් නොවී සමාගම් මගින් ලබාදෙන නිවේදන මත ආයෝජනය කිරීම අවදානම් අඩු ක්‍රියාවකි.

- විවිධ බ්ලොග් අඩවි හෝ වෙබ් අඩවි මගින් විවිධ ව්‍යාජ නම් භාවිතා කරමින් සමහර පුද්ගලයන් ලබාදෙන තොරතුරු මත පිහිටා ගණුදෙනු නොකරන්න. ලබාදෙන සෑම නිර්දේශයක් සඳහාම ඒ නිර්දේශය ලබාදීමට බලපෑ කාරණා පැහැදිළිව දක්වා තිබේදැයි බලන්න.

- තම ආයෝජන උපදේශක වුවද ලබාදෙන නිර්දේශ හොඳින් අධ්‍යයනය කරන්න. කලින් සඳහන් කළ පරිදිම අවසානතීරණය ගනු ලබන්නේ ඔබමය.

- කොළඹ කොටස් වෙළෙඳපොළ නිළ වෙබ් අඩවිය වන www.cse.lk නිරතුරුව පරිහරණය කරන්න. එමෙන්ම ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා වෙබ් අඩවිය වන www.sec.gov.lk වෙබ් අඩවිය හා SEC twitter, FB, YouTube වැනි සමාජ මාධ්‍ය ජාලා මගින් ඔබට නිරතුරුව තොරතුරු ලබා දේ. මෙයට අමතරව කොටස් තැරැව්කාර ආයතන බොහොමයක් ද වෙබ් අඩවි පවත්වාගෙන යනු ලබයි.

- මොබයිල් ඇප් පහසුකම හරහා හෝ කොටස් තැරැව්කාර ආයතනයට පිවිස සී ඩී එස් ගිණුමක් විවෘත කිරීමේදී කොටස් තැරැව්කාර ආයතන ලබාදෙන සියළු ෆෝරම කියවා බලා තේරුම් ගෙන තම අත්සන යොදන්න. එමෙන්ම සියළුම ගණුදෙනු වලදී තම කොටස් තැරැව්කාර ආයතනය විසින් එවනු ලබන ලිපි ලේඛන,(ගැනුම් කුවිතාන්සිය, විකුණුම් කුවිතාන්සිය ආදිය) හොඳින් අධ්‍යයනය කරන්න. එම ලිපි ලේඛන සියල්ලම සුරැකිව තබා ගන්න.

- ගණුදෙනු වලදී ගැටළුවක් පැන නැගුණහොත් ඒ පිළිබඳව ඒ මොහොතේම ලිඛිතව තම කොටස් තැරැව්කාර ආයතනයට දැනුම් දී ඔවුන්ගෙන් විසඳුමක් ලබා ගන්න. එසේ ලැබෙන විසඳුමට එකඟ නොවන්නේ නම් ඒ පිළිබඳව සියළු විස්තර කොළඹ කොටස් වෙළෙඳපොළට ලිඛිතව දැනුම් දෙන්න.

- කොටස් වෙළෙඳපොළට නවක ආයෝජකයකු වශයෙන් පැමිණීමේදී ආරම්භයේදීම ණය මුදල් ලබාගෙන (ආන්තික ණය හෝ කොටස් තැරැව්කාර ආයතනය මගින් ලබාදෙන ණය) ගණුදෙනු කිරීමෙන් වළකින්න. එවැනි දේ වඩාත් යෝග්‍ය වන්නේ කොටස් වෙළෙඳපොළේ ගණුදෙනුවල නියුතුව යම් අත් දැකීමක් ලබාගත් ආයෝජකයන් හටය.

- කොටස් වෙළෙඳපොළට පිවිසීමේදී නිසි ආයෝජන සැළැස්මක් ඔබ සතු විය යුතුය.

කොටස් වෙළෙඳපොළට පැමිණෙන සමහර ආයෝජකයින් හට කිසිම ආයෝජන සැළැස්මක් නොමැතිකම නිසා ආයෝජනයෙන් නිසි ඵල නෙලාගැනීමට අවස්ථාව අහිමි වේ. ඕනෑම ආයෝජකයෙක්, තමන් ආයෝජනය කිරීමට බලාපොරොත්තු වන කාලසීමාව, තම වයස, තමන්ට ගත හැකි අවදානම, තමන්ට ආයෝජනය කළ හැකි මුදල් ප්‍රමාණය, තමන්ට ආදායම් ලැබෙන ක්‍රමවේදය, අනාගත බලාපොරොත්තු ඇතුළු තවත් කරුණ බොහොමයක් පිළිබඳව ආයෝජනය කිරීමට ප්‍රථමව සළකා බැලිය යුතුය. ඒ පිළිබඳව දැඩි අවධානයක් යොමු කළ යුතුය.

- කොටස් වෙළෙඳපොළ ආයෝජනයේදී බොහෝ ආයෝජකයන් විසින් සිදු කරන වරදක් ලෙස පෙන්වා දිය හැකි කරුණක් වනුයේ ආයෝජනයන් සිදුකළ පසු ඒ පිළිබඳව නිසි සොයාබැලීමක් නොකිරීමයි. කොටස් වෙළෙඳපොළ හා සම්බන්ධ තොරතුරු තත්පරයෙන් තත්පරය, විනාඩියෙන් විනාඩිය, පැයෙන් පැය වෙනස් වන අතර ඊට ප්‍රධානවම බලපානුයේ සමාගම්වලට සෘජුව බලාපාන ලාභදායීත්වය, නිෂ්පාදනයන්, කළමානාකාරීත්වය වැනි තොරතුරු මෙන්ම රටේ ආර්ථික, දේශපාලන, විදේශීය, සහ ස්වභාවික කරුණුවල වෙනස්වීමයි.